# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1657/26 - 2010 ජූනි 10 වැනි බ්‍රහස්පතින්දා - 2010.06.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ වැලිගම ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

ඉල්ලා අස්වීම හේතු කොට ගෙන වැලිගම ප්‍රාදේශීය සභාවේ සභිකයෙකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

හේවා වල්ගමගේ මහින්ද කුලතුංග නම් වූ සභිකයා අයත්වන එක්සත් ජාතික පක්ෂය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ වැලිගම ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට ඉහත කී ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු වන නාවිමන ලියනගේ කුලරත්න මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

වැලිගම ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි කන්දඋඩ ආරච්චිගේ සුනෙත් ලෝචන වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, නාවිමන ලියනගේ කුලරත්න මහතා වැලිගම ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

සී. ඒ. සුනෙත් ලෝචන,
තේරීම්භාර නිලධාරි,
වැලිගම ප්‍රාදේශීය සභාව.

2010 ජූනි මස 07 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මාතර.

06-584

1A - G 12962— 360 (2010/06)

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ දැන්වීම

### තිරප්පනේ ප්‍රාදේශීය සභාව

තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වන සෝමසාරගේ තිස්ස විජේසිංහ මහතා, එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙකුව සිටීම අවසන් කර ඇති නිසා, එම සභාවේ ඔහුගේ සභික ධුරය ඔහු විසින් අතහැර ඇති බව තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි එස්. එම්. සමන් බන්දුලසේන වන මම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10 අ(1) (අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

එස්. එම්. සමන් බන්දුලසේන,
තේරීම්භාර නිලධාරී,
තිරප්පනේ ප්‍රාදේශීය සභාව.

2010 මැයි මස 29 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
අනුරාධපුර.

06-585

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.